72. මුද්දර ගාස්තු කාර්යය සඳහා පැමිණිලිකරුවන් මෙම නඩුව රු.1,500,000,000/- කට අගය කර සිටිති.

**එහෙයින් පැමිණිලිකරුවන් මෙම ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ :**

අ) පළමුවන නඩු නිමිත්ත මත, විත්තිකරුගෙන් රුපියල් 500,000,000/- ක මුදලක් මෙදින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා නෛතික පොලිය සමගින් සහ අනතුරුව තීන්දු ප්‍රකාශිත මුළු මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොලියද සමගින් අයකර ගැනීමට සහ නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ප්‍රදානය කරන ලෙසත්,

ආ) දෙවන නඩු නිමිත්ත මත, විත්තිකරුගෙන් රුපියල් 500,000,000/- ක මුදලක් මෙදින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා නෛතික පොලිය සමගින් සහ අනතුරුව තීන්දු ප්‍රකාශිත මුළු මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොලියද සමගින් අයකර ගැනීමට සහ නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ප්‍රදානය කරන ලෙසත්,

ඇ) තුන්වන නඩු නිමිත්ත මත, විත්තිකරුගෙන් රුපියල් 500,000,000/- ක මුදලක් මෙදින සිට තීන්දු ප්‍රකාශ දින දක්වා නෛතික පොලිය සමගින් සහ අනතුරුව තීන්දු ප්‍රකාශිත මුළු මුදල ගෙවා නිමවන තුරු ඒ මත නෛතික පොලියද සමගින් අයකර ගැනීමට සහ නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ප්‍රදානය කරන ලෙසත්,

ඈ) P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව මොනයම් හෝ අපහාසාත්මක ප්‍රකාශයක් කිරීමට විත්තිකරුට හිමිකම් නොමැති බවට ප්‍රකාශයක් කරන ලෙසත්,

ඉ) P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයය සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභින් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන ස්ථිර ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් ප්‍රදානය කරන ලෙසත්,

ඊ) මෙම නඩුව අසා නිමවන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරෙහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභින් සහ

විත්තිකරු යටතේ කටයුතු කරන සියලු දෙනා වලක්වාලන අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් ප්‍රදානය කරන ලෙසත්,

උ) අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් සඳහාවූ ඉල්ලීම අසා තීරණය කරන තුරු, P7 වශයෙන් මේ සමග ලකුණු කර ඇති විශේෂ විගණන කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ/හෝ එහි සාමාජිකයන් සහ/හෝ 01 වන පැමිණිලිකරු සහ/හෝ 02 වන පැමිණිලිකරුට එරහිව අපහාසාත්මක මොනයම් හෝ ප්‍රකාශයක් කිරීමෙන් විත්තිකරු, ඔහුගේ සේවකයන්, නියෝජිතයන්, වැටුප්ලාභින් සහ විත්තිකරු යටතේ කටයුතු කරන සියළු දෙනා වලක්වාලන වාරණ නියෝගයක් ප්‍රදානය කරන ලෙසත්,

ඌ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 16 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ක්‍රිකට් හි සාමාජිකයන් වෙනුවන් මෙ නඩුව පැවරීමට සහ/හෝ පවත්වාගෙන යාමට සහ/හෝ මෙම නඩුව අදාල පියවර ගැනීමට අවසර ලබා දෙන ලෙසත්,

එ) ගාස්තු, සහ

ඒ) මෙම ගරු අධිකරණයට උචිත යැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබා දෙන ලෙසත්ය.

01 වන සහ 02 වන පැමිණිලිකරුවන්ගේ ලේඛනගත නීතිඥ

M. J. S. FONSEKA
Attorney-at-Law,
Notary Public
& Commissioner for Oaths,
NO. 171, BOPITIYA, PAMUNUGAMA.
TEL: 0112238419, MOBILE: 0777701323